

# “මෙම ප්‍රදීපය ඔබට බාරයි”

ජේ. ආර්. ජයවර්ධන

1986.01.13 වැනි දින ගාල්ල ක්‍රීඩාංගනයේ පැවති

පාසැල් පොත් බෙදදීමේ උත්සවයේදී අතිගරු ජනාධිපතිතුමා විසින්

කරන ලද කථාව


| | |
|---|---|
| පරි. අංක | 6569 |
| වර්ග අංකය | 808.51 |
| දිනය | |



# "මෙම ප්‍රදීපය ඔබට බාරයි"


ගරු මහා සංඝරත්නයෙන් අවසරයි. ඇමතිවරුනි. මන්ත්‍රීවරුනි. මිත්‍රවරුනි. මේ උත්සවයට එන්න ප්‍රථම මට ලියුම් රාශියක් ලැබිල තියෙනව පාඨශාලා ශිෂ්‍යයන්ගෙන්. එකක් ගාල්ලේ සංඝමිත්තා විද්‍යාලයේ තරුණ ශිෂ්‍යාවකගෙන්. මම නම කියන්න කැමතියි. චන්ද්‍රිමා ජයසිංහ. ඒ මෙතවිය ඉන්නවද කියල මම දන්නෙ නැහැ. බාගවෙලාවට ඇති මේ පිරිසෙ. ඒ ශිෂ්‍යාව ලියල තියෙනව බුද්ධිය තමයි ඉතාමත්ම වැදගත් වස්තුව. ඒ වස්තුව ලබාගැනීමට නොමිලේ පොත්පත් බෙදීමෙන් ආධාරයක් ලැබෙනව කියල මටත්. රජයටත්. ඇමතිවරුන්ටත් ස්තුති කරනව පොත්පත් ගන්න බැරි ළමයින්ට මවුපියන්ගේ මුදල් නැති නිසා විශාල ප්‍රයෝජනයක් වස්තුවක් ලැබුණ කියල. මේ නොමිලේ පොත්පත් බෙදීමෙන්.

අද පාඨශාලා එකොලොස්දහක් විතර මේ ලංකාවෙ තියෙනව, පාඨශාලා පිරිවෙන් උසස් අධ්‍යාපන පාඨශාලා, විද්‍යා පාඨශාලා කර්මාන්ත පාඨශාලා ආදී එකොලොස්දහක් විතර. ඒ එකොලොස්දහෙ ඉන්නව තිස් හය ලක්ෂයක් ශිෂ්‍යයො. තිස්හය ලක්ෂයක්. විසිනවලක්ෂ විසිපත් දහසක් සිංහල ඉගෙන ගන්න ශිෂ්‍යයො. විසිනව ලක්ෂ විසිපත් දහසක් සිංහල. හයලක්ෂ හැත්තෑපත් දහසක් ද්‍රවිඩ භාෂාව ඉගෙන ගන්න ශිෂ්‍යයො. දෙමළ සහ මුස්ලිම්. මේ තිස් හය ලක්ෂයට පොත්පත් අපි බෙදනව එක්කෝටි විසි ලක්ෂයක්. එක් කෝටි විසි ලක්ෂයට වැඩි ගණනක්. පොත්පත් අද බෙද දෙනව රට පුරාම, යාපනේ ඉඳන් දෙවුන්දරට. මඩකලපුව ඉඳන් කොළඹට බෙදනව. මේ පොත් බෙදන්න සුළු මුදලක් නොවෙයි විශාල මුදලක් වියදම් වෙනව. රුපියල් කෝටි පහලොවක්. කෝටි පහලොවක් වියදම් වෙනව. මේ වියදම නිසයි 1944 ගාල්ලෙ මන්ත්‍රී දහනායක මන්ත්‍රී තුමත්, මමත් යෝජනාව ගෙනාවම රාජ්‍ය මන්ත්‍රණ සභාවෙ හුඟ දෙනෙක් විරුද්ධ වුනේ. අද වනතුරු ක්‍රියා නොකෙරුණේ. නුමුත් අවුරුදු හයකට හතකට ප්‍රථම අපේ මුදල් ඇමතිතුමා කල්පනා කෙරුව නොමිලේ ආහාර දෙනව වාගෙ තමයි නොමිලේ පොත් දීම. ඒ නිසා කොච්චර මුදල් වියදම් වුනත් අපි පොත්පත්

දෙන්න ඕනැ. ළමයින්ට නැත්තම් ළමයින්ගෙ දෙමව්පියන්ට පොත්පත් ගන්න බැරි නම් වියදම් කරන්න බැරි නම් ඒ ළමයින්ට ඉස්කෝලවලට එන්න බැරිවෙයි කියල කල්පනා කරලයි රජය මේ වැදගත් තීරණයට බැස්සෙ. අපි කවුරුත් සන්තෝස වෙනව ; රජයට පුළුවන් වුනා කියල. මේ වැදගත් යෝජනාව ඉෂ්ට කරන්න. මේ පාඨශාලා ආයතන එකොලොස් දහක ළමයි සිංහල, දෙමළ, මුස්ලිම් එකට වාඩිවෙල ඉගෙන ගන්නව. භේදයක් නැතිව, කෝලහලයක් නැතුව. මේ ලංකාව ඒකීය රාජ්‍යයක් යටතෙ පාලනය කෙරෙන රටක් හැටියට. අපි බොහොම සන්තෝෂයි ඒ ගැන. විශේෂයෙන් මමයි, මගෙ ආණ්ඩුවයි.

අපි ජාතිභේද, කුල භේද, ආගම් භේද අනුව නොවෙයි රට පාලනය කරන්නෙ. මගෙ එහෙම කල්පනාවක් කිසි දවසක පහළ වුනේ නැහැ. මේ රටේ පුරවැසිභාවය තියෙන කවුරුත්; මේ රට තම ජන්ම භූමිය හැටියට පිළිගත යුතුයි කියලයි මම කල්පනා කරන්නෙ. එහෙම අපි බෙදුනොත් එහෙම, කෝලාහාල වුනොත් එහෙම ගහගන්න පටන් ගත්තොත් එහෙම ඒ අවාසිය භුක්ති විඳින්නෙ අපි සියලු දෙනාමයි. අවාසනාවකට අද උතුරු නැගෙනහිර පළාත්වල නූගත් පිරිසක් තුවක්කු ආදිය පාවිච්චි කරමින් ත්‍රස්තවාදී ව්‍යාපාරයක් අනුව රට දෙකට බෙදන්න ඕනැ කියල උත්සාහ ගන්නව. ඒ ගැන මම මේ වේලාවෙ කතාකරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. නුමුත් එම ව්‍යාපාරය කිසි දවසක හරියන්නෙ නැහැයි කියල මම කියන්න සතුටුයි. මෙහෙම එක එක්කෙනා මරාගන්නෙ නැතුව යුද්ධායුධ බිම තියල කඳවුරු වහල, සමාව ඉල්ලල අනාගතයේදී අපි ඔක්කෝම එකට වැඩ කරමු කියල මම ප්‍රාර්ථනා කරන්න සතුටුයි.

අපේ රටේ අවුරුදු දෙදහස් පන්සියක් කාලෙ රාජ්‍යයක් සමාජයක් තිබ්ල තියෙනව. මම ලියපු පොත් පිංචක් තමුන්නාන්සේලාට ලැබෙයි. ඒක ගැම ඉස්කෝලෙටම බෙදනව. ඒ පොතේ අදහස් අනුව අපි බලාපොරොත්තු වෙනව ළමයින් අතර වාක්‍ය රචනා තරග පවත්වලා තෑගි දෙන්න. ඒ ගැන සූදානම් වෙලා අපි පස්සෙ දන්වන්නම්: ඒ පොතෙන් පෙන්වන්න හදන්නෙ මේ ලංකාවෙ දීර්ඝ ඉතිහාසය තුල දිවෙන ' රන් සූත්‍ර ' තිබුණ කියල. කාලයක් තිස්සෙ නො කඩවා මේ රටේ ධර්මය තිබුණ. විජය රජ්ජුරුවෝ එන්නත් ප්‍රථම බුද්ධ ධර්මය උගත්වල තියෙනව මේ රටේ. දීර්ඝ කාලයක් අඛණ්ඩ ඉතිහාසයක් තියෙන ධර්මයක් මේ රටේ තිබ්ල තියෙනව. ඒ වාගේම මේ රටේ ඒකීයභාවය තිබ්ල තියෙනව. කාලයක් ඇතැම් පළාත්



විදේශිකයන්ට යටත්වෙලා තිබ්ල තියෙනව. නුමුත් මුළු රටේ ඒකීය රාජ්‍යයක් තිබුණු බව ඒ පොතෙත් පෙන්වල තියෙනව. ඒ වාගේම සිංහල භාෂාව විජය රජ්ජුරුවෝ ආදීන් කථා කෙරුව කියල පෙන්වල දීල තියෙනව. ඒ භාෂාව තමයි අපි තවම කතාකරන්නෙ. අකුරු වෙනස් වෙන්න ඇති, වචන වෙනස් වෙන්න ඇති. මිශ්‍රවෙලා තියෙනව තවත් භාෂාවල් කිහිපයක් සමග. පෘතුගීසි, ඕලන්ද, ඉංග්‍රීසි, ද්‍රවිඩ — ආදී භාෂා සමග. ලෝකෙ පිළිගන්නව සිංහල භාෂාව ආර්‍ය භාෂාවල් වලින් පරණම භාෂාවක් කියල. ඒ වාගේම වාරිමාර්ග ක්‍රම — අපි අනුරාධපුර, පොලොන්නරු ප්‍රදේශයට ගියහම දකුණු පැත්තට, තිස්සමහාරාමයට ගියහම, අවුරුදු දෙදහස් පන්සීයක් කාලෙ අපේ රජවරු වර්ෂාව නැති කාලෙ රටේ ප්‍රයෝජනය සඳහා වර්ෂාව තියෙන කාලෙ වතුර රැස් කරල, එම වැව් වලින් වතුර අරගෙන ගොවිතැන් කළ විශාල වරිමාර්ග ක්‍රම අවුරුදු දෙදහස් පන්සීයක් පවත්වල තියෙන බව අපට පෙනෙනවා. හැබැයි අවුරුදු හාරපන්සීයකට ප්‍රථම අනුරාධපුර පොලොන්නරුව වනාන්තරයට ගියහම මේ ක්‍රමය නැතිවුනා. වර්තමාන කාලයේදී ඩී. ඇස්. සේනානායක මහත්මයගෙ උත්සාහයෙන් ඒ පලාතෙ වාරිමාර්ග වැඩ නැවතත් හදල කලාවැව, නච්චදූව, පරාක්‍රම සමුද්‍ර, තිසාවැව ආදිය හදල, පුරාණ වැව් හදල, ඒ ව්‍යාපාර පටන් ගත්ත. දැන් මෑත කාලයෙදි අපේ රජය ඒ පුරාණ රජවරුන්ට වඩා විශාල ව්‍යාපාර පටන් අරගෙන තියෙනව. රටපුරා, මේ ගාමිණී දිසානායක ඇමතිතුමා පෙන්වා දුන්න වාගෙ, මහවැලි ගඟ ව්‍යාපාරය, ලුණුගම්වෙහෙර, ඉඟිනිමිටිය ආදී විශාල ව්‍යාපාර පටන් ගෙන පෙර පැවැති පරම්පරා වලින් වර්තමාන පරම්පරාවට ඒ වාරිමාර්ග වැඩ නැවතත් අපි ගෙනෙනව. ඒ වාගෙම අපේ රටේ විජය රජ්ජුරුවො ගොඩ බැස්ස දවසෙ ඉඳන් අද ජනාධිපති තෙක් නොකඩවා රාජ්‍ය නායකයෙක් ඉඳල තියෙනව. රජවරු වෙන්න පුලුවනි, ජනාධිපති වෙන්න පුලුවනි, නොයෙක් නොයෙක් වංශවලට අයිති වෙන්න පුලුවනි —ඉන්දියාවෙන් වංශ ආව, එංගලන්තෙන් වංශ ආව, නුමුත් නොකඩවා, ඒ පොතේ තමුන්නාන්සේලාට පෙන්නලා තියෙනවා විජය රජ්ජුරුවො ඉඳන් අද වෙන තුරු අපේ රාජ්‍ය නායකයන්, රාජ්‍යය පාලනය කරන නායකයෙක් නොකඩවා ඉඳල තියෙන බ්ව. මෙවැනි ඉතිහාසයක් තියෙන රටවල් ස්වල්පයයි ලෝකෙ තියෙන්නෙ. අතීතයෙ පටන් ගත්ත ග්‍රීක රාජ්‍යය අද අවසානයි. රෝම අධිරාජ්‍යය අවසානයි. ඉරාන් පර්ෂියන් අධිරාජ්‍යය අවසානයි. ඉන්දියාවෙ බුදුරජාණන් වහන්සෙ වැඩ සිටි කාලෙ තිබුණු රාජ්‍යවල් ඔක්කොම

අවසානයි. ලංකාවෙත් ජපන් රටෙත් විතරයි මෙච්චර දීර්ඝ කාලයක් අඛණ්ඩ පාලනයක් තිබ්බිල තියෙන්නෙ. මේව අපි මතක තියාගන්න ඕනැ. ඒව ගැන අපි ආඩම්බර වෙන්න ඕනැ. නුමුත් මේව ගැන හිත හිත ඉඳල ප්‍රයෝජනයක් නැහැ. අනාගතයේදී අපි සියලු දෙනාම අද ලෝකය වෙනස් වෙන විදිහට වෙනස් වෙන්න උවමනා කියලයි මේ රජය තමුන්නාන්සේලාට දෙන පණිවිඩය.

කොහොමද වෙනස් වෙන්නෙ ? මම ඊයෙ පෙරේද කියෙවුව ඉන්දියාවෙ තරුණ අගමැති තුමාගෙ කථාවක්. ඉන්දියාවෙ ජාතික සංගමයට අවුරුදු සීයක් පිරුනගම උත්සවයක් තිබුණ බොම්බාය නගරයෙ. ඒ උත්සවයෙදි ඒ කථාව කරලා තිබෙන්නේ. මම බලාපොරොත්තු වෙනව ඒ කතාව සිංහලට අච්චු ගහල, දෙමළට අච්චු ගහල, ඉංග්‍රීසියට අච්චු ගහල රට පුරා බෙදන්න. බොහොම වැදගත් කථාවක් ඒක. එතුමා කියන්නෙ එතුමාගෙ ජාතික සංගමය පිරිහිලා තියෙනව කියල.

අද නොයෙක් නොයෙක් නායකයො ඒ රටේ දූෂණ වැඩ කරනව කියල. බොරුවට මහජනය එක්ක ඉන්නව කියල පෙන්වනව විතරයි, නමුත් තමන් එහෙම නොවෙයි ජීවත් වෙන්නෙ, කියල. වස්තුව අයුතු විදියට හොයාගෙන පාවිච්චි කරනව තමන්ගෙ පුද්ගලික ප්‍රයෝජනයට කියලා. බොහොම විශාල ලෙස දොස් කියනව ඇතැම් පිරිසකට එතුමා. අපේ රටටත් ඒ කථාව මම හිතන්නෙ ගැලපෙනව කියලා. එතුමා කියනව ඉන්දියාවෙ ප්‍රජාතන්ත්‍රවාදය එතුමාගෙ පියා, එතුමාගේ පියාගේ පියා, මවු, මවුගෙ පියා, නේරුල, ගාන්ධිල ඒ රටට ගෙනාවා කියල. ගෙනල්ල ආරක්ෂා කරනව කියල, තමන්ගේ රාජ්‍යයත් ඒ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්න බලාපොරොත්තු වෙනව කියල. ආසියාවෙ රටවල් ස්වල්පයක පමණයි ප්‍රජාතන්ත්‍රවාදය තියෙන්නෙ. ඒ නිසා ඉන්දියාවෙ ප්‍රජාතන්ත්‍රවාදය වැදගත් ලෙස ආරක්ෂා කිරීම මනුෂ්‍ය වර්ගයාට කරන යුතුකමක් කියල හිතනව කියල. සම්පූර්ණයෙන්ම ඇත්ත. ඉන්දියාවෙ ඇර මේ මුළු කලාපයේ ශ්‍රී ලංකාවෙ තමයි ප්‍රජාතන්ත්‍රවාදය පවතින්නෙ. අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට අයිති ඔක්කොම ලකුණු, ඔක්කොම අයිතිවාසිකම් තියෙනව, අපි ඒව ආරක්ෂා කරන්න ඕනැ. ඒ වාගෙම එතුමා කියනව අපි මහජනයාගෙ තත්ත්වය උසස් කිරීමට සංවර්ධන වැඩ කරමින් උත්සාහ ගන්න ඕනෙ කියල. රක්ෂාවල් ලබාදීමට, ආදායම් ලබාගැනීමට, තමන්ට උවමනා කරන ආහාර ලබාගැනීමට, තමන්ට උවමනා කරන වස්ත්‍ර ලබා ගැනීමට, නිවාස ලබා ගැනීමට,



මනුෂ්‍යයො, හැටියට ජීවත් වෙන්න, රජයක් මහජනයාට උදව් කිරීම යුතුකමක් කියල. ඒක සම්පූර්ණයෙන්ම ඇත්ත. ඒ නිසා තමයි අපේ රජය මිට ප්‍රථම පාලනතන්ත්‍රවලට වඩා සංවර්ධන වැඩ කිරීමට බලාපොරොත්තු වුනේ. දැන් ඒ සංවර්ධන වැඩ දෙකක් ගැන අපිට කථාවල් අහන්න ලැබුණ. විශේෂයෙන්ම මහවැලි සහ වාරිමාර්ග ව්‍යාපාරවල් ගැන. අධ්‍යාපන ව්‍යාපාරය ගැන. මම හිතන්නෙ අපේ දීර්ඝ ඉතිහාසයෙ මෙච්චර විශාල වාරිමාර්ග, අධ්‍යාපනය, සෞඛ්‍යය, ආදී විශාල සංවර්ධන වැඩ පටන්ගෙන නැහැ, කරල නැහැ මේ යුගයෙ කරනව වාගෙ. අපි බලාපොරොත්තු වෙන්නෙ වාරිමාර්ග වැඩ වලින්, විශේෂයෙන්ම මහවැලි ගඟ කඩිනම් ව්‍යාපාරයෙන් ; ගොවිතැන් වැඩ පමණක් නොවෙයි, ඒ වතුර රැස් කරමින් ජලවිදුලි බලය ලබාදීම බව තමුන්නාන්සේලාට පෙනෙයි. ඒක හැම ගෙදරකටම ප්‍රයෝජනයි. අද අපිට ඒ මහවැලි ගඟ ව්‍යාපාරයෙන් ජලවිදුලි බලය නොලැබුණා නම් අද අපේ රට බංකොලොත් රටක් වෙනව. එච්චර විශාල වියදමක් දරන්න සිද්ධ වෙනව, තෙල් ගේන්න විදුලි බලය නිපදවන්න. මහවැලි ගඟ ව්‍යාපාරය පටන් ගන්නට ප්‍රථම සීයෙන් හතලිහක් අපේ විදේශ විනිමය පාවිච්චි වුනා තෙල් ගෙනල්ල විදුලි බලය නිපදවන්න. අද ඊටත් වඩා විශාල ලෙස විදුලි බලය පාවිච්චිය වැඩි වෙලා තියෙනව. සීයෙන් හතලිහක් නොවෙයි, මේ ජලවිදුලි බලය නො ලැබුණා නම් සීයෙන් සීයක්ම අපි හම්බ කරන විදේශ විනිමය තේ විකුණල, රබර්, පොල් ආදී බඩුමුට්ටු විකුණල ලබාගන්න විදේශ විනිමය ඔක්කොම යනව, තෙල් ගෙනල්ල විදුලි බලය නිපදවන්න. අද එහෙම නොවෙයි, අපිට තෙල්වලට යන වියදම අඩු කරන්න පුලුවන් වෙලා තියෙනව, වික්ටෝරියා, කොත්මලේ, රන්දෙනිගල, රන්ටැඹේ, මාදුරුඔය, උල්හිටිය, ලුණුගම්වෙහෙර, ඉගිනිමිටිය, තිල්වලාගඟ ආදී වැඩ කටයුතු ආරම්භ කරපු නිසා. ඒ වාගෙම ඒ ව්‍යාපාරයෙන් අලුත් ඉඩම් කැලෑ එලි කරල ගොවින් පදිංචි කරල රක්ෂාවල් දෙනව පමණක් නොවෙයි, අපිට උවමනා කරන ආහාර විශේෂයෙන්ම හාල් ආදිය මේ රටේම නිපදවන්න පුලුවන් වෙලා තියෙනව. විස්තර වශයෙන් කියා දෙන්න උවමනාවක් නැහැ, ගාමිණී දිසානායක ඇමතිතුමා ඒව පෙන්වා දුන්න. අධ්‍යාපනය ගැන අධ්‍යාපන ඇමතිතුමා තමුන්නාන්සේලාට පෙන්වා දුන්න. අපි හදන්නෙ පුරාණ විදිහට අධ්‍යාපනය දෙන්න පමණක් නොවෙයි, තාක්ෂණික අදහස් අනුව, මේ නවීන ලෝකයට උවමනා වෙන විදිහට අපේ ශිෂ්‍යයන්ට අධ්‍යාපනයක් දෙන්න. ගුරුවරු පුහුණු කරමින් ඉස්කෝල

ගොඩනැඟිලි හදමින් බංකු පුටු මේස හදමින් පොත්පත් බෙදා දෙමින් නවීන ලෝකයට සුදුසු අධ්‍යාපන ක්‍රමයක් අපේ සිසුන්ට ලබාදෙන්න.

නිවාස ව්‍යාපාරය ගැන බැලුවත් ඒ වගේමයි. රටපුරා ඇවිදිනකොට — කොළඹ ඇවිදිනකොට, නගරවල ඇවිදිනකොට, පාරෙ ඇවිදිනකොට — මීට ප්‍රථම තිබුණේ නැති විදිහට නිවාස හදල තියෙන බව පෙනෙනවා. අහස්යාත්‍රාවේ යනකොට පෙනෙනව ගම් පළාත්වලත්, — නගරවල පමණක් නොවෙයි, — ගම් පළාත්වලත් අලුත් වහළ හදල අලුත් බිත්ති හදල තිබෙන බව. රජයෙන් පමණක් නොවෙයි — මහජනයට මුදල් තිබෙන නිසා පන්සල් අලුත්වැඩියා කරල කෝවිල් අලුත්වැඩියා කරල, තමන්ගේ පාවිච්චියට නිවාස හදල තිබෙනවා. නිවාස ඉදිකිරීම අද පුදුම විදිහට ආරම්භ වෙලා තියෙනව. ඔය වාගෙ වැඩ කටයුතු බැලුවහම සංවර්ධනය අතින් මේ ලංකාව අලුත් යුගයකට පත්වෙලා තියෙනව. සංවර්ධන යුගයක් කියල කියන්නට පුලුවනි. අද මගෙ කථාවල්, අනෙක් ඇමතිවරුන්ගෙ කථාවල් හැම ඉස්කෝලෙකම අහගෙන ඉන්න පුලුවන් ක්‍රමයක් යොදල තියෙනව. තමුන්නාන්සේලාට මේ කථා ඇහෙනව. මම මෙහාට එනකොටත් දැක්කා ළමයි ඉස්කෝලවල ඉන්නව එක්කහුවෙලා රේඩියෝ එකෙන් කතාවල් අහන්න. ඒ හැම ළමයෙකුටම මම කියන්න සතුටුයි, මේ රජයත්, මමත්, ඇමතිවරුත් දිනපතා වැඩ කරන්නෙ, දිනපතා ගමන් කරන්නෙ, දිනපතා ජීවත්වෙන්නෙ තමුන්නාන්සේලාගෙ ප්‍රයෝජනයට බව. එනම් තරුණ පරම්පරාවගෙ ප්‍රයෝජනයට බව.

අද එහෙනම් මම, මීට ප්‍රථම කිවුව වාගෙ — අපිට ප්‍රථම අපේ මුතුන් මිත්තන් විසින් හා අප විසින් මෙතෙක් කාලයක් ආරක්ෂා කරමින් බාර ගෙන සිටිය ප්‍රදීපය අපේ තරුණ පරම්පරාවට බාර දෙනව අනාගතයේදී තමුන්නාන්සේලාගේ ප්‍රයෝජනයට. තමුන්නාන්සේලා සියලු දෙනාටම, මගෙ කථාව අහගෙන ඉන්න තිස් ලක්ෂයක් තරුණයන්ට, තරුණියන්ට අනාගතය අයිතියි කියල — අපි ඒ ප්‍රදීපය බාරදෙනව කියල —මතක් කරමින් තමුන්නාන්සේලා සියලු දෙනාටම දීර්ඝායුෂ ලැබේවා කියල ප්‍රාර්ථනා කරමින් මගෙ කථාව අවසන් කරනව.



අපි ජාතිභේද, කුලභේද, ආගම් භේද අනුව නොවෙයි රට පාලනය කරන්නෙ. මට එහෙම කල්පනාවක් කිසි දවසක පහළ වුනේ නැහැ. මේ රටේ පුරවැසිභාවය තියෙන කවුරුත්, මේ රට තම ජන්ම භූමිය හැටියට පිළිගත යුතුයි කියලයි මම කල්පනා කරන්නෙ. එහෙම අපි බෙදුනොත් එහෙම, කලකෝලාහල වුනොත් එහෙම ගැටෙන්න පටන් ගත්තොත් එහෙම ඒ- අවාසිය භුක්ති විඳින්නෙ අපි සියළුදෙනාමයි.... . . .

(ජේ. ආර්. ජයවර්ධන)

REFERENCE

සැකසුම : ලක්ෂ්මි පීරිස්
ජනාධිපති කාර්යාලයේ ප්‍රකාශනයකි.

රජයේ මුද්‍රණාලයේ මුද්‍රිතයි